දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග 2014 පුනර් පරීක්ෂණය - 2018 ජුනි/ජූලි
Bachelor of Arts General (External) Degree Part I Repeat Examination 2014 – June/July 2018

සිංසා 2.1 - සම්භාව්‍ය සිංහල පද්‍ය කාව්‍යය හා ව්‍යාකරණ සම්ප්‍රදාය
SLG 2.1 - Classical Sinhala Poetry and the Grammatical Tradition

කාලය පැය තුන යි

පළමු වන කොටසට හා II, III කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගෙන,
ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න
නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ

---

## I කොටස

01. පහත දැක්වෙන පද්‍යවල අර්ථ ලිහිල් බසින් ලියන්න.

(අ) මෙ යක් ලු මා හිමි පබවත් ලු ඔහු විදිනී
නිසයුරු අඳුරු කො සමග ගොවළුයෙ කො හස් ඉස්බුම්

පියුමසර වෙති යෙති දෙනෝ පුල් පියුම්විල්හි
මෙවැනියනට මෙ නොතන් වී හැඟැ කුසා බැව් දත්

කව් සිළුමිණ, ඇම්.බී. ආරියපාල (සංස්.)

(ආ) වඳනා සුරන් කිරුළඟ රුවන කැලුමෙනා
බඳනා කොමළ ලතු විලසළ රතින් මනා
මඬනා බැවින් සියපත එහිමි පතුලෙනා
බියෙනා ළතඹ හෝපලු සදිසි වෙවුලනා

වදිමින් සවස නල හැසිරෙන දිගතුවල
සොබමන් සුනිල් මිණි නිල් නුබතුර විපුල
පතසන් අවරගිරි නැටියෙන් වැටෙන කල
විලිකුත් සුරත් පල වැනි වේ රිවි මඬල

සැළලිහිණි සන්දේශය, සුචරිත ගමලත් (සංස්.)

(ඇ) ගින්නෙන් නැගුණු දුම්
දවත හොත් වැද මහ දුම්
එම ගිනි කඳ එ දුම්
කිමැයි නො දවා ද කර විහිදුම්

නිරිඳු සඳ එබසට
බෝසත්හු මුව තඹරට
සිය නෙත් බිඟු විහිට
එසඳ පැවසී තෙපුල් මෙලෙසට

ගුත්තිල කාව්‍යය, ඩබ්.එෆ්. ගුණවර්ධන (සංස්.)

(ඇ) නඳන ගුණ නුවණ යුතු උතුමෝ මහත
නො ගෙන කිසි කරුණු සත සුවපත් කෙරෙත
ලෙලෙන සාමඬුලු යුතු තුරුපෙළ දිමුත
යනෙන සත සතපමින් ගිම් දුර හරිත

රුදුරු ගිනිකඳක් ගත් සඳෙහි වන තුරු
මිතුරු වේ ය දිගතින් හමන මඳ මරු
මිතුරු නැසීමට එම වෙයි පසමිතුරු
මිතුරු නෑ කෙනෙක් නිවතුන් හට කවුරු

සුභාෂිතය, සුචරිත ගම්ලත් (සංස්.)

## II කොටස

02. "කුස ජාතකයෙහි ඇතුළත් කරුණු තම නිර්මාණයට අවශ්‍ය පරිදි සංස්කරණයට ද, එහි නො ඇතුළත් කරුණු උචිත පරිදි එක් කර ගැනීමට ද කව්සිළුමිණකරු පෙලඹී ඇත." සනිදර්ශන ව පහදන්න.

03. ස්වභාව සෞන්දර්ය වර්ණනයෙහි ලා සැළලිහිණි සන්දේශ කවියා දක්වන සාමර්ථ්‍යය, උචිත පද්‍ය ආශ්‍රයෙන් විමසන්න.

04. "බලපුළුවන්කාරකම් කේන්ද්‍රගත වීමත් සමග සැබෑ දක්ෂයා යටපත් වීමේ සමාජ ඛේදවාචකය ගුත්තිල කාව්‍යයෙන් නිරූපණය වෙයි." මෙම ප්‍රකාශය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

05. පාලි, සංස්කෘත සහ ද්‍රවිඩ උපදේශ සාහිත්‍යවල ආභාසය ලබමින්, මානව ධර්මතා පිළිබඳ සියුම් නිරීක්ෂණයක් ඉදිරිපත් කිරීමට සුභාෂිත කවියා සමත් වී ඇති ආකාරය නිදසුන් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

## III කොටස

06. "සිදත්සඟරාවේ සඳ අදියර සිංහල භාෂාවෙහි සන්ධි පිළිබඳ පරිපූර්ණ විග්‍රහයකට වඩා ඡාන්දසික අවශ්‍යතා අරමුණු කොට සකසන ලද්දකි." මෙම මතය පරීක්ෂා කරන්න.

07. 'ක්‍රියා පද' පිළිබඳ සිදත්කතුගේ වර්ගීකරණයෙහි හා විග්‍රහයෙහි පැනෙන ඌනතා සනිදර්ශන ව සාකච්ඡා කරන්න.

08. 'සපදන් විබත' හා තත් විභක්ත්‍යර්ථ පිළිබඳ සිදත්කතුගේ විග්‍රහය විචාරාත්මක ව විභාග කරන්න.

09. අභිමත මාතෘකා තුනකට (03) ප්‍රමාණවත් විවරණ සපයන්න.
   i. අන්අරුත් සමස්
   ii. භව්කිරිය
   iii. නිපා (නිපාත)
   iv. පියෙවි
   v. කිරිය වෙසෙසුන් සඳ